// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2050/34 - 2017 දෙසැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2017.12.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 19/78 (iv)

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත**

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 61 වන වගන්තිය යටතේ, අග්‍රවිනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව, අධිකරණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

තලතා අතුකෝරල,
අධිකරණ අමාත්‍ය.

2017 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති අධිකරණය, එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති නීති කෘත්‍ය වර්ග හෝ කාරණා විභාග කර තීරණය කිරීම සඳහා මෙයින් නම් කරනු ලැබේ.

2. 2017 මාර්තු මස 27 වැනි දින අංක 2012/5 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

**උපලේඛනය**

| *I වන තීරය* *අධිකරණය* | *II වන තීරය* *නඩු, නඩු කටයුතු හෝ කාරණා* |
|---|---|
| කොළඹ අධිකරණ කලාපයේ පිහිටි, ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය. | මහාධිකරණය විසින් විභාග කර තීරණය කරනු ලැබිය යුතු යැයි 2014 අංක 40 දරන පරමාණුක බලශක්ති පනත මගින් ප්‍රකාශිතව ම විධිවිධාන සලසා ඇති සියළු නඩු, නඩු කටයුතු හෝ යම් අනෙකුත් කාරණා. |

01 - 162

1A - PG 3834 — 507 (2017/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*